විශිෂ්ට පරමාදර්ශී අභිමානවත් පළාත් රාජ්‍ය සේවයක්

# පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව - බස්නාහිර පළාත
# மாகாண அரசாங்க சேவை ஆணைக்குழு - மேல் மாகாணம்
# PROVINCIAL PUBLIC SERVICE COMMISSION - WESTERN PROVINCE

අංක 628,10 වන මහල,ජන ජය සිටි ගොඩනැගිල්ල,නාවල පාර,රාජගිරිය இல.628, 10 வது மாடி, ஜன ஜய சிட்டி வளாகம், நாவல வீதி, ராஜகிரிய No.628,10th Floor, Jana Jaya City Building, Nawala Road, Rajagiriya

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Ref. | WPC/PSC/EST02/01/SP-2020 | ඔබේ අංකය / உமது இல. / Your Ref. | | දිනය / திகதி / Date | 2022.05. |

ප්‍රධාන ලේකම් (බ.ප.)

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් (බ.ප.)

සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් (බ.ප.) වෙත,

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධරයන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරග විභාගය 2020 (2022)**

අංක 2,279 දරණ 2022 මැයි මස 06 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ගැසට් පත්‍රය මගින් " **ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධරයන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරග විභාගය 2020 (2022)** " සඳහා අයදුම්පත් කැඳවා ඇත.

02. මෙම විභාගයේ ප්‍රතිඵල මත බස්නාහිර පළාත් තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ 2020.01.01 දින සිට 2020.12.31 දින දක්වා එක් එක් දෙපාර්තමේන්තුවල හා අමාත්‍යාංශවල ඒ ඒ තනතුරේ පවතින පුරප්පාඩු පමණක් පුරවනු ලැබේ.

03. ඒ සඳහා අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන අයදුම්කරුවන් 2020.12.31 දිනට පහත සුදුසුකම් සුපරාලිය යුතු වේ.

I. බස්නාහිර පළාත් තාක්ෂණ සේවයේ අධීක්ෂණ කළමනාකරණ සේවා ගණයේ I ශ්‍රේණියේ අවම වශයෙන් වසර පහ (5)ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර නියමිත වැටුප් වර්ධක පහ(5)ම උපයාගෙන තිබීම,

II. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ(5) තුල සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම,

III. තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වී තිබීම

04. ඉහත සුදුසුකම් සපුරාලන බස්නාහිර පළාත් තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධරයන්ගේ අයදුම්පත් **2022.06.20** දින හෝ ඊට පෙර ලැබෙන සේ " **ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.), අංක: 628, 10** වන මහල, ජන ජය සිටි ගොඩනැගිල්ල, නාවල පාර, රාජගිරිය " යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.


| ලේකම් / செயலாளர் / Secretary | සහකාර ලේකම් (කළමනාකරණ හා ප්‍රතිපත්ති) / உதவிச் செயலாளர் (நிர்வாகம் மற்றும் கொள்கைகள்) / Assistant Secretary (Management & Policies) | සහකාර ලේකම් (විභාග හා බඳවාගැනීම්) / உதவிச் செயலாளர் (பரீட்சைகள் மற்றும் ஆட்சேர்ப்பு) / Assistant Secretary (Examinations & Recruitment) | සහකාර ලේකම් (ආයතන හා ගිණුම්) / உதவிச் செயலாளர் (தாபனம் மற்றும் நிதி) / Assistant Secretary (Establishment & Accounts) | පරිපාලන නිලධාරි / நிர்வாக உத்தியோகத்தர் / Administrative Officer | කාර්යාලය / அலுவலகம் / Office: 011 2879614; ෆැක්ස් / பெக்ஸ் / Fax: 011 2879512; ඊ-මේල් / ஈமெயில் / E-Mail: ppscwpse@sltnet.lk |
|---|---|---|---|---|---|
| 011 2879528 | 011 2879610 | 011 2879317 | 011 2879538 | 011 2879517 | |

05. අයදුම්පත් සම්පූර්ණ කිරීමේදී ගැසට් නිවේදනයේ සඳහන් කරුණු වලට අමතරව පහත කරුණු කෙරෙහිද අවධානය යොමු කරන ලෙස දන්වමි.

I. අයදුම්පත්‍රයේ 03 ඡේදය යටතේ ඇති පදිවි නාමය සඳහන් කිරීමේදී අදාල පරිදි, තාක්ෂණ නිලධාරි (සිවිල් / සැලසුම් /විදුලි / කෘෂිකර්ම උපදේශක / සත්ව සංවර්ධන උපදේශක / තක්සේරු පරීක්ෂක) ආදී වශයෙන් තනතුරු නාමය සඳහන් කළයුතුය.
**නිදසුන :**
**03. පදවි නාමය :- බස්නාහිර පළාත් තාක්ෂණ සේවය (සිවිල්) I ශ්‍රේණිය**

II. පළමු වරට මෙම විභාගයට පෙනී සිටින නිලධරයන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එසේ වුවත් ඉන්පසු වාරවලදී නිලධරයන් විභාගයට පෙනී සිටින්නේ නම් **රු.600/-**ක විභාග ගාස්තුවක් බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ **20-03-02-99** ආදායම් ශීර්ෂයට බැරවන පරිදි බස්නාහිර පළාතේ ළඟම පිහිටි ප්‍රාදේශිය ලේකම් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලද **බ.ප.1 ලදුපතේ** මුල් පිටපත අයදුම්පත්‍රයේ අදාළ කොටුවේ ඇලවිය යුතුය. විභාග ගාස්තු සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලැබේ. විභාග ගාස්තු ගෙවා ලබා ගන්නා ලද ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. මෙම විභාගය සඳහා ගෙවනු ලබන විභාග ගාස්තුව ආපසු ගෙවීම හෝ වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට හෝ ඉඩදෙනු නොලැබේ.

06. ඔබ අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ සිටින සියළුම ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් දැනුවත් කර විභාගයට පෙනී සිටීමට සුදුසු නිලධාරින්ගේ අයදුම්පත් පමණක් එවීමට කටයුතු කරන ලෙස දන්වමි.

07. ගැසට් නිවේදනයේ හා ඉහත 03 ඡේදයේ සඳහන් සුදුසුකම් ඇති නිලධාරින් පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇති සියලුම අයදුම්පත් විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කරනු ලබයි.

08. තවද එක් එක් තනතුරට අදාලව 2020 වර්ෂයේ පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව, 2013.06.01 දින සිට ක්‍රියාත්මක බස්නාහිර පළාත් තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ 10.3 ඡේදයට අනුව පිරවීමට කටයුතු කරනු ලබන බව වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

09. අයදුම්පත් කැඳවීමේ නිවේදනය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේද පළකර ඇත

තිලක් සෙනරත්
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත